ශීර්ෂ 313-මධ්‍යම පළාත් සභාව

---

1. දැක්ම, මෙහෙවර හා කාර්යභාරය

1.1 දැක්ම

මධ්‍යම පළාතේ අභිමානවත් ජනතාවට සෞභාග්‍යමත් ජීවිතයක් ලබාදීම ඉලක්ක කර ගනිමින් ශ්‍රී ලංකාවේ විශිෂ්ඨතම පළාත් සභාව බවට පත් කිරීම.

1.2 මෙහෙවර

මධ්‍යම පළාතේ මුළු මහත් ජනතාවට උරුම සංස්කෘතික, සමාජ, ආර්ථික තත්ත්වයන් හා ස්වාභාවික පරිසරය රැකෙනා අයුරින් නවීන තාක්ෂණය භාවිතා කර මානව හා භෞතික සම්පත් කාර්යක්ෂමව හා ඵලදායී ලෙස යොදා ගනිමින් මධ්‍යම පළාතේ ජනතාවට තිරසාර අභිමානවත්, උසස් ජීවන තත්ත්වයක් උදාකර දීම.

1.3 කාර්යභාරය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ හා 1987 අංක 42 දරන පළාත් සභා පනතේ විධිවිධාන පරිදි කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම.

2. විසර්ජන ගිණුම

මුළු ප්‍රතිපාදනය හා වියදම

මධ්‍යම පළාත් සභාව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 32,805.00 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 31,252.50 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු. මිලියන 1552.5 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 4.73 ක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2019 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | % |
| පුනරාවර්තන | 29,730.00 | 29,730.00 | - | - |
| මූලධන | 3,075.00 | 1,522.50 | 1,552.50 | 50.49 |
| එකතුව | 32,805.00 | 31,252.50 | 1,552.50 | 4.73 |

3. විගණන නිරීක්ෂණය

ශීර්ෂය යටතේ පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන පළාත් සභාව විසින් පළාත් සභාවේ අරමුදල යටතේ ගිණුම්ගත කර උපයෝජනය කර තිබුණි. පළාත් සභාවේ අරමුදල විගණනය කර ඒ පිළිබඳ විගණකාධිපති වාර්තාව යථා කාලයේ දී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.